
# නව තාක්ෂණ විස්මයන්

ස්ටැන්ලි මෙරින්නගේ

ඇමෙරිකාව, යුරෝපාකරණය, ජපානය ආදී ධනවත් රටවල වැසියන්ගේ අධි සුඛෝපභෝගී ජීවන රටාව අනුගමනය කරන්නට, අප වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටවල වැසිඬන්ට දැඩි ආශාවක් ඇතිවීම ස්වභාවික ය. එහෙත් ඔවුන් ගත කරන නාස්තිකාර ජීවන රටාව අනුගමනය කරන්නට අප උත්සාහ කළොත් එය අපේ රටවලට දැරිය නොහැකි බරක් වන බවද එලෙසින් ම අනිවාර්ය ය. එසේ හෙයින් දුප්පත් අපටත් සරිලන, එමෙන් ම ධනවත් වැසියන්ගේ අධිපරිභෝජන රටාව නිසා කෙරෙන සම්පත් නාස්තිය ද වලකන තාක්ෂණික විශ්මයන් කිහිපයක් ඔබට හඳුන්වා දෙන්නට අපි උත්සාහ කරමු.



## ප්‍රතිදීප්ත පහන – එෆ්ලාම්පුව (Flamp)

ලාම්පුවකින් ආලෝකය විහිදුවා ගන්නට නම් විදුලිබලය හෝ වෙනත් ඉන්ධන ශක්තියක් අප එම ලාම්පුවට ලබාදිය යුතු වෙයි. එහෙත් ස්පාඤ්ඤ සැලසුම් ශිල්පියෙක් නිර්මාණය කළ ප්‍රතිදීප්ත පහන එවන් බාහිර ශක්ති උපකාරකයක් නොමැතිව ආලෝකයෙන් ම ආලෝකය විහිදුවයි.

දීප්තකාරක තීන්ත වර්ගයක් අලේප කරන ලද මෙම ලාම්පුවට පිටස්තර ආලෝක ප්‍රභවයකින්, එනම් සූර්යාලෝකය විදුලි ලාම්පුවක ආලෝකය හෝ ඉටිපන්දමක එළිය වුවද උරා ගැනීමේ ප්‍රබල හැකියාවක් ඇත.

ඉන් පසුව එම පිටස්තර ආලෝකය නිවා දැමූ විට එතැන් පටන් විනාඩි 20 ක කාලයක් තතිවම ආලෝකය විහිදවමින් මෙම එෆ්ලාම්පුව ප්‍රභාමත්ව පවතියි.

## ඉලෙක්ට්‍රොනික් උපකරණ සළුපිළිවල පළඳිමු.

සෙලියුලර් දුරකථනය, **MP** 3 ගීත ධාවකය, තවත් නොයෙකුත් විද්‍යුත් උපාංග සහ ඒවා ම ශක්තිය සපයන විද්‍යුත් කෝෂ ආදී සියල්ල සවි කෙරුණු සූක්ෂම කබායක් ඇඟලන්නට ඔබ කැමති ද?

එපමණක් ද නොව විද්‍යුත් කෝෂ බැටරි වෙනුවට කබා රෙද්දෙන් ම විද්‍යුත් ශක්තිය නිපදවා දෙන්නට ද දැන් උත්සාහ දැරේ. රෙදි යාරයකට වොට් 100 ක බලයක් නිපදවෙන ආකාරයට ඉතාමත් තුනී සිලිකන් පටලයන්ගෙන් නිෂ්පාදනය කෙරෙන සූර්ය කෝෂ මගින් විදුලිය උපද්දන්නට ස්කොට්ලන්තයේ පේෂකර්ම පර්යේෂකයෝ උත්සාහ දරමින් සිටිති.



අනාගතයේ අපේ සළුපිළිවලින් ම බලය සැපයෙන ඉලෙක්ට්‍රොනික උපාංග සහිත ඇඳුම් ඇඟලන්නට දැන් සිට ම සැරසෙමු.



## තණකොල කපන රොබෝ යන්ත්‍රය


දෙපහරේ (two-stroke) එන්ජින් සවි කළ සම්ප්‍රදායික තණ කපන යන්ත්‍රවලින් වසරකට හයිඩ්‍රොකාබන අංශු මෙට්‍රික්ටොන් බිලියනයක් පමණ වායුගෝලයට එකතු කරන අතර එය වායු දූෂණයට තදින්ම හේතු කාරක වෙයි.

හඳුන්වා දෙන නව රොබෝ යන්ත්‍රයේ පරිසර හිතවාදීත්වය කෙතෙක් ද යත්, එය වායුගෝලයට කිසිදු අපද්‍රව්‍යයක් එකතු නොකරයි. එයට හේතුව, එම යන්ත්‍රය ක්‍රියාත්මක වීමට ශක්තිය උපයා ගන්නේ නැවත පණගැන්විය හැකි(rechargeable) විද්‍යුත් කෝෂත් / බැටරියක් මගින් නිසා ය.

එමෙන් ම යන්ත්‍රය ක්‍රියාත්මක වන විට කිසිදු ඝෝෂාකාරී හඬක් නගන්නේ ද නැත.

තණකොල කැපීම සඳහා යොදා ගත් සති අන්තයේ දී ඔබ කළ යුත්තේ, කැපිය යුතු සීමාවේ පරිධිය සලකුණු කර දී පසෙකට වී නිස්කලංකව හිඳගෙන සිටීම පමණකි.


මෙම ස්වයංක්‍රීය යන්ත්‍රය යා යුත්තේ කොහේදැයි හැඳින, නිහඬව ම තම කාර්යය ඔබ වෙනුවෙන් ඉටු කරනු ඇත.



## රෙදි වියලන එක්ස් බමරය (Spin-x)

බටහිර රටවල සෑම නිවසක ම පාහේ භාවිත වෙන්නේ අධික ලෙස විදුලිබලය කා දමන රෙදි වියලන යන්ත්‍ර වන අතර මේ යල්පැන ගිය දුර්වල තාක්ෂණය ඉවතලන්නට දැන් කාලය පැමිණ ඇත.

ඒ වෙනුවට හඳුන්වා දෙන නව යන්ත්‍රය "එක්ස් බමරය" රෙදි වියලන්නට කේන්ද්‍ර අපසාරී බලය භාවිතා කරයි. අක්ෂයක් වටා කැරකෙන විට බඹරය තුළ දමා ඇති රෙදිපිළි විනාඩි 2 ක් වැනි සුළු කාලයක් ඇතුළත සම්පූර්ණයෙන් ම පාහේ වියලා දමන්නට එය සමත් වෙයි. අක්ෂයක් වටා කැරකෙන විට කේන්ද්‍රයෙන් ඉවතට අධි වේගයෙන් විසිවී යාමේ විශිෂ්ඨ තාක්ෂණය භාවිතා කරන මෙම එක්ස් බමරය විදුලිය දවන්නේ ද ඉතා අඩුවෙනි. 8 එම කාර්යයට කරන්නට පැරණි සම්ප්‍රදායික වියලන යන්ත්‍රය විනාඩි 30 ක් වැනි දීර්ඝ කාලයක් ගත කරයි. ඒ නාස්තිකාර දුර්වල යන්ත්‍රය තව දුරටත් අපට කුමකට ද?




# කොම්පියුටර් වෙනුවට සිම්පියුටර්

ඉන්දියානු ශාස්ත්‍රඥයන් විසින් ලෝකවාසී ග්‍රාමීය දිළිඳු ජනයා වෙනුවෙන් ම අවධානය යොමු කොට වර්ධනය කරන ලද නවතම උපකරණය සිම්පියුටරය යි. එය බැංගලෝරයේ පිහිටා ඇති එන්කෝර් නම් වූ මෘදුකාංග සමාගම විසින් නිෂ්පාදනය කෙරෙයි.

රූප ආශ්‍රිත ප්‍රස්ථාර සහ ශබ්ද භාවිත කළ හැකි මෙම අතේ ගෙන යා හැකි ඉන්ටර්නෙට් උපකරණය ඕනෑම අයකුට පහසුවෙන් පාවිච්චි කළ හැකි වෙයි.

සිම්පියුටරය තුළ සියළුම ලිපිගොනු පෞද්ගලික විශේෂ කාඩ්පතක ගබඩා කර ඇති අතර එක ගමක සියළුදෙනාට එක යන්ත්‍රයක් ප්‍රමාණවත් වෙයි.

දේශගුණය ගැන තොරතුරු අස්වනු මිල ගණන් ආදිය බොත්තමක් එබූ සැනින් ලබා ගත හැකි වන බැවින්, වඩාත් අඩු සම්පත් භාවිත කරමින් වඩාත් ඉහළ ඵලදාවක් ලබා දෙන්නට ගොවියන්ට හැකි වනු ඇතැයි, මෙම යන්ත්‍රය නිපදවූ ශාස්ත්‍රඥයෝ පවසති.




# නොමිල ශීතකරණය

කුඩා මැටි බඳුනක්, විශාල මැටි බඳුනක් තුළට බහා ඒ දෙක අතර හිඩැස තෙත වැලිවලින් පුරවා සාදන ලද විස්මයජනක ශීතකරණය තුළ පලතුරු සහ එළවළු සති තුනක් වැනි දීර්ඝ කාලයක් නරක් නොවී තබා ගත හැකි බව නයිජීරියානු පර්යේෂකයෙක් සොයා ගෙන ඇත.


බටහිර රටවලට පමණක් නොව අපට වුවද මෙය අවධානය යොමු කළ යුතු වැදගත් කාරණයක් නොවන්නේ ද?

# සෙලියුලර් දුරකථනයට අවශ්‍ය බලය අතින් ම



සෙලියුලර් දුරකථනයට අවශ්‍ය බලය අපටම නිපදවා ගත හැකිව තිබියදී නිකරුනේ බැටරි බලය නාස්ති කරන්නේ ඇයි?

ඕනෑම දුරකථනයකට සවි කළ හැකි, අතින් කරකවා බල ගැන්විය හැකි බැටරියක් කොතරම් අගනේ ද? තත්පර හතළිස් පහක කාලයක් කරකවා වයින් දැමූ විට, විනාඩි පහක කාලයක ඇමතුමකට බලය ලබා දෙන බැටරියක් මෝටරෝලා සමාගම විසින් නිපදවා ඇත.



මෙම ක්‍රමය කැමරා ෆ්ලෑෂ් බල්බ සහ ගුවන්විදුලි යන්ත්‍ර සඳහා ද ජනප්‍රිය වෙමින් පවතින අතර සෙලියුලර් දුරකථන ගැන ලෝකය පුරා දැඩි උනන්දුවක් ඇති වී ඇති අද දවසේ මෙය වඩාත් වටිනාකමක් ඇති ක්‍රමයක් වනු ඇත.